සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

- අංක 01, 02 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ යෙදුම්වලට වඩාත් උචිත අර්ථය තෝරන්න.

01. නිලධාරීන් අතර පැවති කඹ ඇදීම නිසා බොහෝ යෝජනා සම්මත කර ගැනීමට නොහැකි වූ බව පෙනිණි.
 1. අනවබෝධය  2. එකඟ බවක් නැතිවීම  3. ශක්තිමත් නොවීම  4. එකඟතාව

02. රටේ අර්බුදකාරී අවස්ථාවල ඇතැම් වෙළෙඳුන් ගිනි කන්නන් බවට පත් වී ඇතැයි චෝදනා කෙරේ.
 1. අඩු ම මිලට බඩු විකුණන්නන්  2. අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නන්
 3. අධික මිලට බඩු විකුණන්නන්  4. තක්සේරු මිලට අලෙවි කරන්නන්

- පහත වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

03. නිවැරදි විචාරයක් තුළින් උසස් සාහිත්‍ය නිර්මාණ ........................................ ආධුනිකයන් යොමු කළ හැකි ය.
 1. පරිශීලනයට  2. පරිහරණයට  3. විචාරයට  4. අධ්‍යයනයට

04. භාෂා .................................. වර්ධනය කර ගැනීම සඳහා මුලින් ම කළ යුත්තේ හොඳින් සවන් දීමයි.
 1. ප්‍රමුඛතාවන්  2. නවතාවන්  3. සමානතාවන්  4. ශක්‍යතාවන්

05. මූර්ධජ අක්ෂරයක් යෙදී ඇති වචනය තෝරන්න.
 1. සංඛ්‍යාව  2. හක්ගෙඩිය  3. තද්ධිත  4. කාන්සිය

06. සියලු ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පිළිතුර තෝරන්න.
 1. සංවර්ධනය, නිරූපණය, ජනගහණය, වර්තමාන  2. කනිෂ්ඨ, ඛනිජ, ප්‍රවීණ, ආවේණික
 3. පිළියෙල, කොළරාව, සලකුණු, කැලණි  4. නිශ්චල, ප්‍රාශ්වාස, දෘෂ්ටිය, සමස්ථ

07. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති පිළිතුර තෝරන්න.
 1. අකුරැස්ස, අහංගම, අක්මීමන, අඹේපුස්ස  2. හලාවත, හම්බන්තොට, හන්දෙස්ස, හල්පිට
 3. මහරගම, මස්කෙළිය, මන්දාරම්නුවර, මහනුවර  4. කතරගම, කන්දේගම, කල්පිටිය, කහතුඩුව

08. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොවන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
 1. රත්න - රුවන්  2. කසුන් - කාංචන  3. අටවිය - වළ  4. මිණිමුතු - පුබුදු

09. නොගැළපෙන යුගල පදය තෝරන්න.
 1. දුක් දොම්නස්  2. කුඩු මහත්  3. සැපසනීප  4. අරුමපුදුම

10. අර්ථයෙන් එකිනෙකට විරුද්ධාර්ථවත් පදයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
1. ආයාත - නිර්යාත 2. ආධුනික - නුපුහුණු
3. ස්වාධීන - පරාධීන 4. අල්පශ්‍රැත - බහුශ්‍රැත

11. නාම විශේෂණ පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් ඇතුළත් වාක්‍යය තෝරන්න.
1. විකසිත පුෂ්පයෝ සුවඳ විහිදුවති. 2. ලලනාවෝ ජලක්‍රීඩා කරති.
3. වෙළෙන්දෝ අධික මිලට බඩු විකුණති. 4. වැසි සමයේ ගංගා වේගයෙන් ගලා බසියි.

12. ඉරි ඇඳි පදවල ක්‍රියාපද වර්ගය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
i පිළිමල් වන මීවුන් <u>දකු</u> නුදුරා ii එද ලොබ <u>හැර</u> ඔබ සමගින්
iii ඔබ එනතුරා මග <u>බලමින්</u> iv සුමුදු සුදු වලාවන් <u>මිදෙතු</u> දළදා මැඳුරු
1. විධික්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
2. විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
3. ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

13. "ජරමර අස්සේ බර කරත්ත" යන ප්‍රස්තාව පිරුළේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. අඩු කරදරයකින් වැඩි කරදරයකට පත්වීම
2. පිහිටක් පතා ගිය විට කරදරයකට පත්වීම
3. කරදර පැමිණෙන්නේ කලින් දැනුම් දීමකින් තොරව බව
4. එක් කරදරයක් පිට තවත් කරදර පැමිණීම

14. පහත දී ඇති පද අතුරින් තුනක් එක ම පදයක බහ්වර්ථ පද වේ. වෙනස් පදය තෝරන්න.
1. ශක්‍රයා 2. රෝදය 3. යහපත් 4. හක්ගෙඩිය

15. මුලින් දී ඇති පදයේ අර්ථය වැරදි ලෙස යෙදුණු පිළිතුර තෝරන්න.
1. අසත්පථයේ - වැරදි මගේ 2. එකරුත්තේ - ඔඩොක්කුවේ
3. කිඳේලකි - කුඩා දිය වළකි 4. අකාරිය - පැමිණි කාර්යය

- **16 හා 17 ප්‍රශ්නවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි ව යෙදී ඇති පිළිතුර තෝරන්න.**

16. 1. ඇතැමෙක් හොඳින් පාඩම් කරති. 2. පොලිස් භටයෝ සැකකරුවෝ අල්ලා ගත්හ.
3. එක් අයෙක් තරගයෙන් ඉවත් වූහ. 4. මැණියන් දැ නිති පන්සිල් රකින්නී ය.

17. 1. ගංගාවෝ ගලා බසියි. 2. පුහුණුකරුවන් විසින් ක්‍රීඩකයෝ පුහුණු කෙරෙති
3. බමුණන් විසින් යාග කරන ලදහ. 4. තොප බුදුන් වැන්දෙහු.

18. අර්ථය හා අදාළ නිපාත නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ප්‍රමාණාර්ථය - තරම්, සා, විතර
2. කාලාර්ථය - එම්බ, කොළ, බොල
3. සීමාර්ථය - විනා, හැර, මිස
4. භාවාර්ථය - පිණිස, උදෙසා, සඳහා

19. "කවියෙන්, ගීයෙන්, විරිතින්, තනුයෙන්....." යන යෙදුම් අයත් වන කාව්‍යාලංකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.
1. උපමා 2. රූපක 3. අනුප්‍රාසය 4. එළිවැට

20. පහත දැක්වෙන වාක්‍යාංශ සමග තනිපදය ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
අ) අනුන්ගෙන් පෝෂණය වන ඉ) අද්විතීය
ආ) කිසිවකට දෙවන නොවන ඊ) පරපෝෂිත
ඇ) කෙලෙහිගුණ නොසලකන උ) බහුශ්‍රැත
ඈ) බොහෝ ඇසූ පිරූ තැන් ඇති ඌ) අකෘතඥ
1. අ - උ 2. ආ - ඉ 3. ඇ - ඊ 4. ඈ - ඌ

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- මෙම කොටසේ 01 හා 02 අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්තිකාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. බිත්ති පුවත්පත සඳහා ඔබ යොදා ගත් තේමාව කුමක් ද? (ලකුණු 02)
2. ඒ සඳහා ඇතුළත් කළ නිර්මාණ හතරක් නම් කරන්න. (ලකුණු 04)
3. අදාළ තේමාව සඳහා තොරතුරු රැස් කළ විධි හතරක් ලියන්න. (ලකුණු 02)
4. එම ක්‍රියාකාරකම එළිදැක්වීමට පෙර ඔබ විශේෂයෙන් අවධානය යොමු කළ කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)
5. මෙම ක්‍රියාකාරකමෙහි සාර්ථක ලෙස නියැලීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 4ක් ලියන්න. (ලකුණු 04)

(ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන ඒ යටතේ වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

1. මා දිනු රට මට අගෙයි
2. පරිසරය රැකුණොත් අපත් රැකෙයි
3. අපේ ආහාර ප්‍රශ්නයට විසඳුම් සොයමු
4. අපේ ජන සාහිත්‍යය
5. අපේ ගම් ප්‍රදේශය ගංවතුරෙන් යට වූ දා ......

(ලකුණු 14)

03. සඳගලතැන්න මහා විද්‍යාලයීය "රත්සර ප්‍රභා" වාර්ෂික විවිධ ප්‍රසංගය මෙවරත් උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට විදුහල්පතිතුමා, ආචාර්ය මණ්ඩලය හා සිසු දරු දැරියන් විසින් සංවිධානය කර ඇත. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි වේ. එම අවස්ථාවට සහභාගි වන මෙන් දන්වා දෙමව්පියන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 10)

04. පෙළපොතේ ඇතුළත් පහත ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. "හොඳයි තමුන්නාන්සේ ඕනෑ කොංගෙඩියක් කරගත්තට කාරි නෑ"
   i. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?
   ii. එහි රචකයා නම් කරන්න.
2. "ඔයා හරි හපනා - මං ඔයාට සුබ පතනවා!"
   i. මේ අනුව හපන්කම් දැක්වූයේ කවුරුන් ද?
   ii. මෙම ප්‍රකාශය උපුටා ගත් කෙටිකතාව ලියන්න.
3. "සිටු දුවණියෝත් නායක සිටු දූ තරමටත් අනාගාමී ඵලයටත් පැමිණෙති"
   i. මෙසේ කීවේ කවුරුන් විසින් ද?
   ii. මෙම ප්‍රකාශය ඇතුළත් කථා වස්තුව උපුටා ගත් මුල් කෘතිය ලියන්න.
4. "එය ද කළ හැකි වන්නේ ඔබට පමණයි"
   i. මෙහි ඔබට යන්නෙන් අදහස් වන්නේ කවුරුන්ට ද?
   ii. මෙහි මුල් කෘතියේ රචකයාගේ නම ලියන්න.
5. "ඒ මිනිහව තිට අඳුනන්න පුළුවන් ද?
   i. මෙහි තිට යනුවෙන් ඇමතුවේ කවුරුන්ට ද?
   ii. මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණය සඳහා මූලාශ්‍රය කරගත් කෘතිය කුමක් ද?

05. පහත දැක්වෙන කෘතිවල කතුවරුන් ලියන්න.

i. මගේ කෙටි හැඳින්වීම -
ii. කවි දසුන -
iii. රන් තැටියක කඳුළු -
iv. මග දිගට ජනකතා -
v. ආසියාතික කලාව -
vi. ළදරු ගී -
vii. වෙසක් පහන -
viii. සාහිත්‍ය විචාර සංහිතා -
ix. සිංහල සිරිත් විරිත් -
x. ගඟ ළඟ දී -

(ලකුණු 1 × 10 = 10)

06. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පැරණි සිංහලයන්ගේ විද්‍යා හා තාක්ෂණ ඥානය ප්‍රකට කරන සාධක අතර වැව් හා ඇළවල් මුල් තැනක් ගනී. ඔවුන්ගේ ජලසම්පාදන ක්‍රම, ජල විද්‍යාවේ මූලධර්ම මත ගොඩනැගුණු සුවිශේෂ දැනුමක් අවශ්‍ය වූත් බෙහෙවින් සංකීර්ණ වූත් ක්‍රියාවලියක් විය.

ඇළහැර වේල්ලත්, මිනිපේ වේල්ලත්, කලාවැවේ ජලය අනුරාධපුරයට ගෙන යන ජයගඟ නම් වූ ඇළත් අපේ නිර්නාමික කාර්මික ශිල්පීන්ගේ විශේෂඥභාවය හෙළි කරන ශ්‍රේෂ්ඨ නිර්මාණ අතර වැදගත් වේ. වරෙක ලන්දේසි ඉංජිනේරුවරයෙකු යෝධ වැව නිර්මාණය සදෝස් යැයි ප්‍රකාශ කළේ ය. ඔහුට පිළිතුරු දුන් ඉංග්‍රීසි ඉංජිනේරුවරයාගේ පිළිතුර වූයේ උපකරණ හා ක්‍රම දෝෂ සහිත වූ ඒවා මිස යෝධ වැවේ මුල් සැලැස්මේ කිසිදු දෝෂයක් නැති බවයි. මෙවන් උසස් තත්ත්වයක පැවති සිංහලයන්ගේ වාරිකර්මාන්තසථ කෞශල්‍යය හා කීර්තිය විදේශ රටවල පවා පැතිර තිබූ බව පෙනේ. ක්‍රිස්තු වර්ෂ745 දී කාශ්මීරයේ රාජ පදවිප්‍රාප්ත ජයපීඩ රජු තම රටේ ජලාශ හා ඇළවල් කැණීම පිණිස සිංහල කාර්මිකශිල්පීන්ගේ සහාය ලබා ගත් බව රාජ තරංගනී නම් වූ කාශ්මීර වංශකතාවේ සඳහන් වේ.

i. පැරණි සිංහලයන්ගේ විද්‍යා හා තාක්ෂණ ඥානය ප්‍රකට කරන සාධකය කුමක් ද?
ii. ඔවුන්ගේ ජල සම්පාදන ක්‍රම කෙබඳු ක්‍රියාවලියක් වී ද?
iii. අපේ කාර්මික ශිල්පීන්ගේ විශේෂඥභාවය ප්‍රකට කරන නිර්මාණ දෙකක් දක්වන්න.
iv. ලන්දේසි ඉංජිනේරුවරයාට ඉංජිනේරුවරයාට ඉංග්‍රීසි ඉංජිනේරුවරයා දුන් පිළිතුර ලියන්න.
v. පැරණි දවස සිංහල කාර්මික ශිල්පීන්ගේ දැනුම විදේශ රටවල පවා පැතිර තිබූ බවට ඇති සාක්ෂ්‍යයක් දක්වන්න.

(ලකුණු 2 × 5 = 10)

07. පහත පදවල අර්ථ ලියා දක්වන්න.

i. පතළ -
ii. චිරන්තන -
iii. කෙළක් -
iv. ධූර්තයෝ -
v. නිකෘෂ්ට -
vi. අනතිමානී ගුණය -
vii. පුරෝගාමියා -
viii. සංයමය -
ix. විමෝචනය -
x. පුල හෙළ කුසුම -

(ලකුණු 1 × 10) = 10)